ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 2022-11-29 |

පැමිණිලිකාරිය : එච්.පී.ජී ශ්‍රියන්ති මිය,
අංක 287/7, නාමල් පෙදෙස,
කටුවාන, හෝමාගම.

වගඋත්තර පාර්ශවය : 1. සාමාන්‍යාධිකාරී,
ජාතික ඉතිරිකිරීමේ බැංකුව,
අංක 255, ගාලු පාර,
කොළඹ 03.

2. කළමණාකරු,
ජාතික ඉතිරිකිරීමේ බැංකුව,
අංක 255, ගාලු පාර,
කොළඹ 03.

**පැමිණිලි අංකය : HRC/949/17**

පැමිණිල්ලේ කරුණු දැක්වීම :-

ඉහත පැමිණිලිකාරිය විසින් 2017.03.03 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තමා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ III - I ශ්‍රේණියට ඇතුළත් වීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි බවත්, 2016.06.02 දින නිකුත් කර ඇති සේවා ඇගයීම් වශයෙන් ලබා දී ඇති ලකුණු (05) ක ප්‍රමාණය නොලැබීම, චක්‍රලේඛ අංක 615/2005 හි සඳහන් වී ඇති පරිදි ලබා නොදීමෙන් පැමිණිලිකාරියට උසස්වීම් නොලැබුනු බවත්, ඒ තුළින් අසාධාරණයක් සිදුව ඇති බවත්, පැමිණිලිකාරියට වඩා අඩු සුදුසුකම් ලබා ඇති,

1. ජී.ඩී.එම්.ටී අබේසේකර
2. එස්.ඩී.එස්.ඩී පෙරේරා
3. තුසිත දිසානායක

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் : 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04.
සභාපති / தவிசாளர் : 011-2505451
ෆැක්ස් / தொலைநகல் : 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் : sechrcsl@gmail.com

4. නිහාල් ගුණරත්න
5. ඉන්දික ජයසූරිය

යන අයවලුන්ට උසස්වීම් ලබා දුන් බවයි.

<u>වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම.</u>

ජාතික ඉතිරි කිරීමේ බැංකුව (III)-(II) ශ්‍රේණියේ සිට (III) –(I) ශ්‍රේණියට උසස් වීම සඳහා 2016 වර්ෂයේ නොවැම්බර් මස පැවති සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටිය ද කළමණාකාරීත්වය විසින් ගනු ලැබූ තීරණයකට අනුව 2016.09.20 වන දින ප්‍රකාශයට පත් කරන ලද වැ.බ.නියෝජ්‍ය සාමාන්‍ය අධිකාරී (මානව සම්පත් සංවර්ධන ) ලිපි අංක 08/2016 මඟින් සාමාන්‍ය අධිකාරී චක්‍ර ලේක අංක 615/2005 දරණ උසස් කිරීමේ පටිපාටියට අනුව (III) –(I) උසස් වීම් ලබාදීම සඳහා (III)-(II) ශ්‍රේණියේ එක් වසරක් සම්පූර්ණ කරන ලද සේවා නියුක්තිකයන්ගේ අයදුම්පත් කැඳවන ලද බවත්, පැමිණිලිකාරිය මේ සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් සපුරා තිබීම නිසා සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීමට අවස්ථාව ලබා දුන් බවයි.

ඒ අනුව අයදුම්කාරියගේ අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් සේවා කාලය ක්‍රියාකාරීත්වය ඇගයීම් සඳහා පැමිණිලිකාරිය විසින් ලබා ගන්නා ලද පෞරුෂත්වය,සන්නිවේදන හැකියාව ,නායකත්ව හැකියාවන් විෂය පිළිබඳ දැනුම යන ක්ෂේත්‍ර ඇගයීමකට ලක් කර පැමිණිලිකාරිය වෙත ලකුණු ලබාදීමට කටයුතු කර ඇති බවයි.
සම්මුඛ පරීෂණයේ ප්‍රථිඵල 2017.02.08 වන දින බැංකුවේ අභ්‍යන්තර ජාලය හරහා සාමාන්‍යාධිකාරි චක්‍ර ලේක අංක 1777/17 මඟින් ප්‍රකාශයට පත් කළ බවත් එහිදී ශ්‍රියන්ති මිය හට සුදුසුකම් සම්පූර්ණ කර නොතිබීම නිසා උසස් වීම ලැබී නොමැති බවයි.

<u>පරීක්ෂණයේ දී අනාවරණය වන කරුණු</u>

පැමිණිලිකාරිය කොමිෂන් සභාවට වාචික හා ලිඛිත දේශන ලබා දීමෙන් ප්‍රකාශ කරනු ලබන්නේ,

1. ජී.ඩී.එම්.ටී.අබේසේකර
2. එස්.ඩී.එස්.ඩී.පෙරේරා
3. තුසිත දිසානායක
4. නිහාල් ගුණරත්න
5. ඉන්දික ජයසූරිය

යන අයවලුන් තමාට වඩා අඩු සුදුසුකම් ලබා ඇතිමුත් සම්මුඛ පරීක්ෂණය කළ සම්මුඛ පරීක්ෂණ මඩුල්ල(ත්‍රිපුද්ගල) තමාට සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු 30 ක ප්‍රමාණයක් ලබා දීමේදී අසාධාරණයක් වී ඇති ද යන්න ලේඛන හා දත්තයන් මෙන්ම වාර්තා ලබා ගනිමින් කළ පරීක්ෂණයේදී හඳුනාගත් කරුණු මත පැමිණිලිකාරිය මීගොඩ බැංකු ශාඛාවේ සහකාර කළමණාකාරිණියක් ලෙස වසර 1 ½ කාලයක් සේවය කර ඇති බව අනාවරණය වේ.සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු 30 ක ලකුණු ප්‍රමාණය ලබා දීමට ක්‍රියා කර ඇති ආකාරය හා පදනම මෙන්ම නිර්ණායකයන් පිළිබඳව වගඋත්තර පාර්ශවය කොමිෂමට නිසි පරිදි ලකුණු ලබා දුන් එක් එක් සම්මුඛ පරීක්ෂණ නිලධාරීන්ගේ ලකුණු පිළිබඳව දත්ත ලේඛන කොමිෂමට ඉදිරිපත් කිරීමට අපොහොසත් වී ඇත.සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි අයවලුන්ගේ ලකුණු ලබා දුන් පොදු ලේඛනයක් පමණක් කොමිෂම් සභාවට

ඉදිරිපත් කළ අතර ඒ තුළින් නිසි පැහැදිලි වීමක් නොමැත.පැමිණිලිකාරිය විසින් අභියෝගයට ලක් කරන ලද සෙසු අයදුම්කරුවන් 05 දෙනාට ලකුණු ලබාදීම පිළිබඳව දත්ත විශ්ලේෂණය පිළිබඳව නිසි පැහැදිලි කිරීමක් හෝ ලේඛන යොදා ගත් ආකාරය පිළිබඳව පැහැදීමක් නොමැත.එයට අදාල දත්ත ලේඛන ද කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමට නොහැකි විය.

වගඋත්තර පාර්ශ්වය විසින් 2018.01.08 වන දින කොමිෂන් සභාවට ලබාදී ඇති ලිපියට අනුව ,පැමිණිලිකාරිගේ සේවා ඇගයීමේ ලිපියට ලකුණු ලබාදී නොමැති බව සඳහන් කර ඇතද , එයට 2018.01.08 දිනැති ලිපිය තුළින් සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී කොමිෂමට දන්වා ඇත්තේ එයට ලකුණු ලබා දීමට නම් සභාපතිතුමාගේ හෝ සාමාන්‍යාධිකාරීතුමාගේ අත්සනින් නිකුත් කරන ලද ප්‍රශංසනාත්මක ලිපි සඳහා පමණක් බවයි.එනමුත් පැමිණිලිකාරිය හට සේවය ඇගයීමේ ලිපිය ලබා දී ඇත්තේ ප්‍රධාන කළමණාකරු(සේවක මණ්ඩල) විසිනි.මෙහිදී පැමිණිලිකාරියට අසාධාරණයක් සිදු වී ඇති බව පැහැදිලි වේ.එයට හේතු සාධකය වන්නේ ප්‍රධාන කළමණාකරු විසින් සේවය ඇගයීමේ ලිපිය නිකුත් කිරීම සඳහා ආයතන ප්‍රධානියා වන සභාපතිතුමාගේ හෝ සාමාන්‍යාධිකාරවරයාගේ අවසරය ලබා ගෙන සේවා සහතිකය නිකුත් කර ඇති බව අනිවාර්ය කරුණක් වන හෙයින් ඒ සඳහා පැමිණිලිකාරියට ලකුණු ලබා නොදීම සාධාරණ කරුණක් නොවන බව අනාවරණය වේ.

පැමිණිලිකාරිය වසර 31 ක කාලයක් සේවය කර ඇති අතර එම කාලය තුළදී ද වැඩබලන සාමාන්‍යාධිකාරීවරියක් ලෙස කටයුතු කර තිබියදී ඇයට පසුව බැඳුණු එනම් 1996,2001, 2004 යන වසරවල සේවයට බැඳුණු අයට උසස්වීම් ලබා දී ඇති බව කොමිෂන් සභාව පරීක්ෂණයේදී ලිඛිත දේශන ලබා දුන් අතර එය නිශ්ප්‍රභා කිරීමට වගඋත්තර පාර්ශවය අපොහොසත් විය.

<u>නිගමනය</u>

ඉහත කරුණු සලකා බැලීමේදී පැමිණිලිකාරියට වඩා පසුව සේවයට බැඳුණු අයවලුන්හට හා සම්මුඛ පරීක්ෂණයේදී ලබා දුන් ලකුණු පිළිබඳව පැහැදිලි ලේඛන ඉදිරිපත් නොවන බැවින් ද සුදුසුකම් අඩු අයවලුන්ට උසස්වීම් ලබාදීම තුළින් ද පැමිණිලිකාරියට ලැබීමට සුදුසු තිබිය හැකි සුදුසුකම් සඳහා ද ලකුණු ලැබී නොමැති බැවින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මඟින් සහතික කොට ඇති පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන ආකාරයෙන් වගඋත්තරකරුවන් ක්‍රියා කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

<u>නිර්දේශය:</u>

පැමිණිලිකාරියගේ උසස්වීම හා අදාළ වැටුප් පෙරදාතම් කරමින් හිඟ වැටුප් සහිතව උසස්වීම ලබාදීමට කටයුතු කරන ලෙසට වගඋත්තරකාර පාර්ශවයට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

මෙම නිර්දේශය අනුව කටයුතු කර 2022. 12 . 30 වන දිනට පෙර වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත මෙයින් දන්වා සිටිමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර,එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වා සිටිමු.

රෝහිණී මාරසිංහ,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපතිනි,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

13/23

ම.හේ.නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka